# මුට්ටි මංගල්‍යයේ අතීතය හා වර්තමානය පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්

(ආණමඩුව ප්‍රදේශයේ වඩත්ත වැව් ගම්මානය ඇසුරින්)

පී.ඒ.ජී.කේ.එච්. කුලරත්න

සිව් වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*kularathne00@gmail.com*

පුරාණ සිංහලයින් විශේෂයෙන් ම ජලය පිළිබඳ සැලකිලිමත් වූ පිරිසක් වූහ. ඔවුන්ගේ අර්ථ ක්‍රමය ගැමි ගොවි අර්ථ ක්‍රමයක් වූ නිසා ගොවිතැන සඳහා වැයවන ජලය කෙරෙහි දැක්වූයේ එය "මහත්ය" යන සංකල්පයයි. ඒ නිසා පුරාණ සිංහල ගැමියන් ජලය රැස් කිරීම කෙරෙහි මහත් වුවමනාවක් දක්වන ලදී. පුරාණ සිංහල රජවරු බොහෝ දෙනෙකු පවා වෙහෙසුනේ ගොඩනැගිලි ඉදිකරනවාට වඩා වැව් ඉදිකිරීමටයි. ඒ බව මහාවංසය, රාජාවලිය, පූජාවලිය වැනි මූලාශ්‍රය සාක්ෂි දරයි. ලංකාවට පැමිණි ආර්යයන් පවා තමන්ගේ මුල් ජනාවාස පිහිටුවා ගනු ලැබුවේ ගංගා නිම්න ආශ්‍රිතව ය. මුල් කාලීන මානවයින් පවා ජනාවාස සකසා ගත්තේ ජලය ලබා ගැනීමට පහසු ස්ථානයක් ආශ්‍රිතව ය. උදාහරණයක් වශයෙන් කුරුවිට බටදොඹ ලෙන ආශ්‍රිත ව ජලය පහසුවෙන් සපයා ගැනීමට හැකි වූ ස්ථානයක් නිසා එම ස්ථානය මානව ජනාවාසයක් බවට පත් විය. ඒ අනුව යමින් දැදුරු ඔය, මල්වතු ඔය, මහවැලි ගඟ, යාන් ඔය වැනි ස්ථාන ආශ්‍රිත ව පුරාණ ජනයා තම ජනාවාස පිහිටුවා ගනිමින් ගොවි හා වාරි ශිෂ්ටාචාරය ගොඩනංවන ලදී. සෑම පුරාණ ගමක් ම පාහේ ඉදි වී ඇත්තේ වැවක් කේන්ද්‍ර කරගෙන බව පෙනීයයි. ගම්මානයේ නමේ අග කොටසට "වැව" යන කොටස එක් කිරීමෙන් එය වඩාත් තහවුරු වේ.

මේ අනුව නිර්මාණය වූ ගැමි ජන ජීවිතය හා බද්ධ වූ සිරිත්විරිත් හා ඇදහිලි ක්‍රම සමුදායක් වශයෙන් අභිචාර ක්‍රම දැක්විය හැකි ය. මෙම සියලු කාර්යයන් ඉටු කරන ලද්දේ ජන ජීවිතයේ ආරක්ෂාව හා සෞභාග්‍යය පවත්වා ගෙන යාම සඳහා ය. ඒ කාර්යයන් ඉටු කිරීමෙන් ජන ජීවිතවලට පැහැදිලි ප්‍රතිඵල ලැබෙන බව වර්තමාන සමාජය තුළ දී පිළිගැනීමට ලක් නොවුනත් අතීත සමාජය තුළ සියලු කාර්යයන් ඉටු කරන ලද්දේ මෙම සිරිත්විරිත් හා ඇදහිලිවලට මූලිකත්වය දීමෙනි. ඒ පිළිබඳව අත්දැකීම්ලත් පැරණි ගැමියන් පවසන්නේ, තමන්ට හා තමන්ගේ වැඩිහිටියන්ට එයින් ප්‍රතිඵල ලැබුණු

බව ය. මේ ආකාරයට සිදු කරන අභිචාර ක්‍රම විශාල ප්‍රමාණයකි. ඒ අතර "මුට්ටි මංගල්‍යය" මූලික අභිචාර ක්‍රමයකි. සාම්ප්‍රදායික පූජා පිළිවෙතක් වන මුට්ටි නැමීමේ මංගල්‍යය වැව් ගම්මානයකින් තවත් ගම්මානයකට වෙනස් වේ. ඒ නිසා ම ඒ ඒ ගංවලට සීමා වූ පුද සත්කාර පිළිවෙත් වැවේ කිරි ඉතිරුම හා බැඳී පවතී. (ඒ.එච්.එම්. උක්කුමැණිකා)

වැවත්, ගමත්, ගොවිතැනත් ආරක්ෂා කිරීම සඳහා සිදුකරන මූලික අභිචාර ක්‍රමයක් වන මුට්ටි මංගල්‍යයේ අතීත තත්ත්වය හා එයට උරුම ව ඇති වර්තමාන තත්ත්වය බොහෝ සෙයින් වෙනස් වී ඇත. සමාජ ක්‍රමයේ වේගවත් ගමන එයට මූලික හේතුව වී ඇත. එමෙන් ම නූතන සමාජය එම කාර්යයන් සුළු කොට තැකීම නිසා ද ඒවා සමාජයෙන් වෙන් වී යාමට හේතු වී ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වඩත්ත වැව් ගම්මානය මෙහි දී අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිත ව මෙම මුට්ටි මංගල්‍යයට අදාළ කාර්යයන් අතීතයේ තරමට නොවුනත් යම් ප්‍රමාණයක් දුරට සිදු කෙරේ. වැව් ගම්මානවල මිනිසුන් තමන් නෙලා ගන්නා ලදඅ ස්වැන්නෙන් පළමු කොටස වෙන් කළේ දෙවියන් උදෙසා ය. කුල ක්‍රමාවලිය මෙම ගම තුළ දැඩි ව පවතී. ගොවිගම කුලයේ මිනිසුන් වැඩි ප්‍රමාණයක් වාසය කරන මෙහි මිනිසුන් වැඩි ප්‍රමාණයකගේ ප්‍රධාන ජීවනෝපාය ' මාර්ගය වන්නේ ගොවිතැන ය. මෙම මංගල්‍යය නොකඩවා වසරකට වරක් පැවැත්වීම සිදුකරයි. මෙම චාරිත්‍ර සමාජයෙන් ඈත්ව යාමට ස්වාභාවික ක්‍රියාවලියේ ද බලපෑම් ඇති වේ. නමුත් වසර කිහිපයක් නිසි පරිදි වර්ෂාව නොලැබීම හේතුවෙන් මෙය යම් දුරකට කඩ වීම ද සිදු වී ඇත. (ඒ.එච්.එම් රංබණ්ඩා - පෙර සිටි වෙල් විදානේ කෙනෙකි)

මෙම මුට්ටි මංගල්‍යය බැඳී පැවතුණේ වාරි සමාජය තුළ ය. එවක සමාජය තුළ මෙහි සියලු චාරිත්‍ර අත්නොහැර කටයුතු සිදුකර ඇති බව මෙම ගම්මානයේ පැරැණ්නන් සඳහන් කරයි. අතීතයේ එසේ වුවත් මුට්ටි මංගල්‍යය හා සබැඳි මිනිස් ආකල්ප හා සිරිත්විරිත් වර්තමාන ජන ජීවිතය තුළින් ගිලිහී යාමට ලක් ව ඇති බව පැහැදිලි කිරීම මෙහි මූලික අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස දත්ත රැස් කිරීමේ දී ද්විතීයික දත්ත රැස් කිරීම මෙන් ම ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රමය භාවිත කරමින් තොරතුරු ඇතුළත් කරන ලදී. මේ හා බැඳුණු වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාව ඇත්තේ ඒ හා සම්බන්ධ ව කටයුතු කළ පැරණි පුද්ගලයින්ගෙන් එම සංස්කෘතිය ඔවුන්ගේ ජන ජීවිතය හා බද්ධ වී තිබූ නිසාවෙනි. අනෙක් අතට මෙය පැරණි වාරි සමාජය නිරූපණය කරන එක් පැතිකඩක් වශයෙන් දැක්විය හැකි ය.

මුට්ටි මංගල්‍යය බැඳී පැවතුනේ වාරි සංස්කෘතිය ක්‍රියාත්මක වූ සමාජය තුළ ය. ගැමියා තමන්ගේ ජීවිතය සඳහා උපකාර කරන වැවත්, ජීවත් වන ගමත්, ජීවනෝපාය වන ගොවිතැනත් ආරක්ෂා කිරීම සඳහා මෙම අභිචාර ක්‍රමය සිදුකළ අතර එයින් තමන්ගේ ජීවිතය පවා ආරක්ෂා වන බව ඔවුන් විශ්වාස කරන ලදි. මේ හා සම්බන්ධ චාරිත්‍ර ක්‍රමානුකූලව ඉටු නොකිරීමෙන් අදෘශ්‍යමාන බලවේග විසින් තමන්ගේ ජීවිතයට හා කෘෂිකර්මාන්තයට

බලපෑම් කරන බව පැරණි ගැමියන් ප්‍රකාශ කරන්නේ තම වැඩිහිටි පරම්පරාව ලත් අත්දැකීම් තුළිනි. එම බාහිර බලවේග තුළින් ඇතිවන බලපෑම බොහෝ ප්‍රබල බව අදටත් මෙම ප්‍රදේශයේ වෙසෙන පැරණි ගැමියන් විශ්වාස කරයි. පැරණි සමාජය තුළ මෙම චාරිත්‍ර සියල්ල ම පිළිවෙලින් සිදු කළේ සියල්ලන්ගේ ම යහපත උදෙසා ය. ඒ සඳහා නිවැරදි පේ වීමක් අවශ්‍ය වේ. මේ සඳහා මූලික වශයෙන් දිනයක් වෙන් කරනු ලබයි. මෙහි දී ගමරාලගේ මූලිකත්වයෙන් වැඩිහිටියන් හා එක්ව දිනයක් තෝරා ගන්නා ලද අතර එම දිනය අනිවාර්යයෙන් කෙම්මුර දිනයක් විය යුතුය. ඒ සඳහා සෙනසුරාදා කෙම්මුර දවසක් ලෙස යොදා ගනියි. ඉන් පසුව මෙහි චාරිත්‍ර ආරම්භ කිරීම සිදුකරයි. චාරිත්‍රවලින් කොටසක් සෙනසුරාදා දින සිදුකරන අතර ඉතිරි කොටස ඉරිදා දින සිදුකරයි. මෙම කටයුතු සියල්ල සඳහා සහභාගී වන්නේ පිරිමි පාර්ශවය පමණි. ඒ සඳහා ඔවුන් දින ගණනක් පේ වී මෙම කාර්යයන් සඳහා දායක වෙයි. (එ.එච්.එම්.හේරත්බණ්ඩා, ගම්මානයේ කපු මහතා)

කන්න ක්‍රමය අනුව වගා කටයුතු කරන අතර එම කටයුතු ආරම්භයට පෙර අයියනායක දෙවියන්ට පඬුරු වෙන් කිරීමක් සිදුකරයි. එසේ සිදු කරන්නේ ගොවිතැනට අවශ්‍ය ජලය කලට වේලාවට ලැබී වගාව උවදුරුවලින් ආරක්ෂා කර දෙන මෙන් ඉල්ලමිනි. වගාවෙන් ලැබෙන අස්වැන්නෙන් පළමු කොටස දෙවියන් වෙත ලබා දෙන බව පොරොන්දු වෙමින් ගමේ දේවාල භූමියේ උයන් ගෙඩියක් (පොල් ගෙඩියක්) ඉල්ලා පොරොන්දු වෙයි. අස්වැන්න ලබාගත් පසුව ගැමියන් සූදානම් වන්නේ දෙවියන් සඳහා දේව මංගල්‍යය සිදු කිරීමට ය. මංගල්‍ය සඳහා අවශ්‍ය සහල්, පොල්, කැවුම්, පලතුරු, මුදල්, එකතු කර ඒවා කපු මහතාගේ නිවසට රැගෙන යයි. මෙම ද්‍රව්‍ය සුදු රෙද්දක ඔතා ශබ්ද වාදන මධ්‍යයේ උඩු වියන් යටින් කපුරාල මහතාගේ නිවසේ සිට මුරුකන් කඳ කරේ තබාගෙන වැව් සංහිඳට යයි. ඉන් අනතුරු ව ඇති සියලු කාර්යයන් සිදුකරන්නේ වැව් සංහිඳ මත සිට ය. වැව් සංහිඳ මත මල්පැලක් ඉදි කිරීම ද සිදු කරයි. (ඒ.එච්.එම්.හේරත්බණ්ඩා, ගම්මානයේ කපු මහතා)

වැව් සංහිඳ මෙහි දී මූලික වේ. වැව යනු විශාල ප්‍රදේශයක් පුරා විසිරුණු වපසරියකි. ඒ නිසා වැවට දක්විය යුතු පුදසත්කාර පිළිගැන්වීම උදෙසා සිරිත්විරිත් සම්මතයෙන් ම නිශ්චිත නැතත් ඒවා වෙන් කරගෙන ඇත. එය "සංහිඳ" යනුවෙන් හඳුන්වයි. බොහෝවිට මෙය වැවේ සංහිඳ වශයෙන් හඳුන්වයි. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ වැවේ සංහිඳ පිහිටා ඇත්තේ වෑ බැම්මේ හෝ ඒ අද්දරක වීමයි. සංහිඳ යනු විශාල වෘක්ෂයකි. පරම්පරා කිහිපයක් වැවේ රාජකාරි කටයුතු සියල්ලත් මැනවින් හඳුනන සංහිඳ සඳහා ඇටවුම් බසින ලද වනස්පතියක් තෝරාගෙන තිබේ. අවට පදාසයක් වසාගෙන අතු විහිදා සිටින සංහිඳ සඳහා බෝ ගසක් හැර නුග, කෝං, පලු, වීර වැනි කාලාන්තරයක් පවතින ගසක් තෝරා ගැනීම ජන සම්මතය වේ. (වැව හා සංස්කෘතිය)

මේ අයුරින් තෝරාගත් වැවේ සංහිඳ පරම්පරා විකාශයක් බැවින් එය වෙනස් කිරීම ද තහංචියකි. ගංකරයේ සිටින ගොවීන් සියලු දෙනා බාරහාර

වන සංහිඳ ඒ ගංකරයට පොදු වූවක් ද වේ. වැව දෙකෙළවර හෝ ගංකරයේ හත්අට පොළක යෝධ වනස්පතීන් තෝරාගෙන සංහිඳ හැටියට බාර ගැනීම සිරිත් සම්මත තහංචියකි. මේ අනුව වැව යනු දියවර සපයන භූමියක් නොව සංහිඳ ද ඇතුළත් කොටසකි. යලමහ දෙකන්නයේ මඩ ගොවිතැනේ යෙදීමට පෙර වගාව ආරක්ෂා කරදෙන මෙන් පිහිට පැතීම වැවේ සංහිඳ අද්දර දී සිදු වන්නකි. (වැව හා සංස්කෘතිය)

මෙහි දී ගන්නා ලද නව අස්වැන්නෙන් කිරි ආහාර හෙවත් කිරිබත් පිසීම සිදුකරයි. කිරිබත් මුට්ටි 7ක් පිසීම සිදු කරන අතර ඒවා පිස ගැනීමෙන් අනතුරු ව මල්පැල වටේට තැබීම සිදු කරයි. මෙහි දී කඩවර දෙවියන්ට වැඩි අවධානයක් යොමු කර ඇත. කිරිබත් මුට්ටි 7න් හැඳි 7ක් බෙදා කැවුම් ගෙඩි 7ක් ද කෙසෙල් ගෙඩියක් ද තබා එය ඇවරි කණුව නමින් සකස් කරන ලද ස්ථානයක තබයි. මේ අතරට බුලත් හා පුවක් ආදිය ද එක් කරයි. මෙහි මූලික වන කඩවර දෙවියන් හා ගෙතුණු විවිධ කතා කිහිපයක් ඇති බව මෙහි පැරණි ජනයා පවසයි. ගම්මුන් විශ්වාස කරන්නේ මෙම දෙවියන් වැව රැකීමේ දී මූලිකත්වය ගන්නා බව ය. මෙම දෙවියන් වැව රකිනවා මෙන් ම නිවැරදි ව පූජාව නොකරන්නේ නම් දෙවියන් කෝප වී ගමට කරදර කරන බව ඔවුන් විශ්වාස කරයි. ඒ නිසා කඩවර ගොටුව පිදීමේ දී මහත් සැළකිල්ලෙන් එය පිදීම සිදු කරයි. (ඒ.එච්.එම්.හේරත්බණ්ඩා,ගම්මානයේ කපු මහතා)

සෙනසුරාදා දිනයේ කටයුතු මේ ආකාරයෙන් වෙයි. දෙවැනි දින එනම්, ඉරිදා දින ගැමියන් අලුයම අවදි වී නව අස්වැන්නේ ගත් වීවලින් වී කොටා බතක් පිස ව්‍යංජනයක් ද සකස් කර සියලු දෙනා එකතු වී එම ආහාරය අනුභව කර දහවල් 12 පමණ වනවිට වියනක් බැඳ නැවතත් වංගෙඩි මෝල්ගස් භාවිතා කර අලුත් වී කොටයි. මෙහි ඇති විශේෂත්වය වන්නේ මේ සඳහා සහභාගී වන්නේ පිරිමි පාර්ශවය පමණි. එය සිරිතකි. ඔවුන් ඒ සඳහා දින කිහිපයක් පිලිහිටි නොකා පේ වී සිටිය යුතු ය. එදින පිරිස වැවට ගොස් දිය නා පිරිසිදු වී සුදුවතින් සැරසී වැවෙන් වතුර කලයක්, පිල අත්තක් හා පොල් කටුවකට ගොම ස්වල්පයක් ගෙන වියන බඳින ලද මඩුවට ඉසියි. එසේ පිරිසිදු කරගත් මඩුවේ පැදුරක් එලා වංගෙඩිය එහි තබා එයට සුදු පිරුවටයක් බැඳ දුම් අල්ලන ලද කුල්ලකට වී ස්වල්ප ප්‍රමාණයක් රැගෙන එය වංගෙඩියට දමා කොටනු ලබයි. පසුව එම සහල්වලින් බත් මුට්ටි 7ක් පිසියි. මෙහි දී ව්‍යංජන ලෙස පුහුල් ව්‍යංජනයක් හා හත් මාලුවක් පිසීම සඳහා ගස්ලබු, කෝලිකුට්ටු කෙසෙල්, පලා ගසක්, වම්බටු, මුරුංගා, දියමස් හා ගොඩමස් යොදා ගනී. එය මෙදිනට විශේෂ අංගයක් වේ. මේ වැඩ කටයුතු අවසානයේ එදින හවස සහල් සේරු 10න් පමණ කැවුම් උයයි. ඒවා " වක්කරන කැවුම්" වශයෙන් හඳුන්වයි. මෙම කැවුම් උයා ඉතිරි වන තෙල් කලින් පිසින ලද හත් මාලුවට එක් කරයි. රාත්‍රී 12 වූ පසුව මේ සියලු දෑ රැගෙන වැව් සංහිඳ අසලට ගොස් හත් තට්ටුවකට යහනක් සකස් කර සුදු රෙදි කැබැල්ලකින් එය වසා මැස්ස යට සුදු රෙද්දක් මත රැගෙන ගිය සියලු භාණ්ඩ තැන්පත් කරයි. පසුව පොල්මල් 7ක් රැගෙන යහන් 7ක් වෙන් කරයි. එසේ

වෙන් කරන්නේ මලල බණ්ඩාර, සෙල්ලම් බණ්ඩාර, උඩුවේරිය බණ්ඩාර, කීර්ති බණ්ඩාර, පනෙක්කි බණ්ඩාර වැනි දෙවියන් සඳහා ය. (ඒ.එච්.එම්. හේරත්බණ්ඩා,ගම්මානයේ කපු මහතා)

කපු මහතා සුදු පිරුවට ඇඳ මුඛය වසා සෙනසුරාදා දින සිදු කළ පරිදි ම සකස් කර ගන්නා ලද යහන් 7ට බත් හා ව්‍යංජන බෙදයි. කැවුම් ගෙඩි 27ක් හා කෙසෙල් ගෙඩි 27ක් වශයෙන් යහන් මත තබයි. කඩවර ගොටුව ද මේ ආකාරයට තබයි. මීට අමතර ව පහළින් තබා ඇති වී දමන ලද කුල්ලට ද පෙර පරිදි බත්, ව්‍යංජන, කැවුම්, කෙසෙල් ගෙඩි තබයි. එසේ තබන්නේ නීලමහා යෝධයා සිහි වීම පිණිස බව ගැමියන් ප්‍රකාශ කරයි. වංගෙඩිය උඩ නැඹිලිය තබා එයට බත් හා ව්‍යංජන බෙදයි. මීට අමතර ව කැවුම් 7ක් හා කෙසෙල් ගෙඩි 7ක් තබා පන්දමකින් ආලෝකය ලබා දෙයි. එසේ පූජා කරන්නේ ගම භාර කර ඇති ගම්බාර දෙවියන් සඳහා ය. මේ ආකාරයට හත් තට්ටුවේ රාජකාරි අවසන් කිරීමෙන් අනතුරු ව මෙම මුට්ටි මංගල්‍යයේ කාර්යයන් අවසන් වෙයි. (ඒ.එච්.එම්.හේරත්බණ්ඩා,ගම්මානයේ කපු මහතා)

මේ තුළින් එදා ජනයා හා අද ජනයා ජලයට, වර්ෂාවට, ජලය රැස්කර තබා ගන්නා වැවට කෙතරම් භක්තියක් දක්වන්නේ ද යන්න තහවුරු කරගත හැකි ය. මේ මංගල්‍යයට ගමේ සියලු දෙනා සහභාගි විය යුතු ය. යමෙක් මෙය හිතාමතා මගහරියි නම් ඔහුට දෙවියන්ගේ ආරක්ෂාව නැතිවී යන බව ඔවුන් විශ්වාස කරයි. කෙසේ වෙතත් අතීතයේ මෙම මංගල්‍යයේ දක්නට ලැබුණු තත්ත්වයන් වර්තමානය වනවිට සමාජයෙන් ඉවත් වී යමින් පවතී. මෙම අභිචාර විධි වත්මන් සමාජයෙන් වෙන් වී යාමට බලපා ඇති කරුණු කිහිපයකි. අතීතයේ ගමේ පැරැණ්නන්ට තිබුණු ගෞරවය නව පරම්පරාව තුළ දක්නට නොමැති වීමත් වත්මන් පරපුර වැඩිහිටියන්ගෙන් දැනමුතුකම් ගැනීමට මැලිකමක් දක්වන බව මෙහි වැඩිහිටියන් සඳහන් කරයි. නව පරපුර මෙම අභිචාර විශ්වාස නොකරයි. ඒ නිසා ඔවුන් මෙම සම්ප්‍රදායන්ට ගරු නොකිරීම තුළ සම්බන්ධ වීම අඩු මට්ටමක පවතී. එමෙන් ම අතීතයේ ශබ්ද පූජාව බෙර ශබ්ද හා වෙඩිමුර මඟිනි. මේ සඳහා එයට අදාල ව පෙරහැර ද පැවතුනි. නමුත් වර්තමාන සමාජය තුළ දී මෙම බෙර වාදනය කළ ජනතාව එම කාර්යයට මැලිකමක් දක්වන බව මතය වී ඇත. එයට හේතුව වී ඇත්තේ කුලය යන පදනම ය. එම කුලයට අයත් පැරණි ජනතාව මෙම කාර්යය සඳහා දායක වුවත් එම පරපුරට අයත් නව පරපුර මෙම කාර්යය කිරීමට අකමැති වීමයි. කුල භේදය මෙහි දී මතුවන මූලික හේතුවක් වී ඇත. අතීතයේ තුවක්කු භාවිතා කිරීම සමාජය තුළ තිබුණත් වර්තමානයේ ඒ සඳහා අවසර නැත. මේ කරුණු නිසා ශබ්ද පූජාව වැනි චාරිත්‍ර වියැකී යයි. (ඒ.එච්.එම් රංබණ්ඩා-පෙර සිටි වෙල් විදානේ කෙනෙකි)

චාරිත්‍ර අඩු වීම සඳහා ආර්ථිකය ද සෘජුවම බලපෑම් කිරීම, පැරණි ජනතාව ගොවිතැන් කටයුතු සිදු කරන ලද්දේ ආර්ථිකය මූලික අරමුණ කරගෙන නොවේ. නමුත් පසුගිය කාලයේ දී ගොවි ජනපද ව්‍යාපෘතිය පැමිණීම තුළ මිනිසුන්

කෘෂිකර්මාන්තය සිදු කරන්නේ ආර්ථික වාසි මූලික කරගෙන ය. ඒ නිසා ඔවුන් චාරිත්‍රවාරිත්‍රවලට වඩා අස්වැන්න ආරක්ෂා කර ගැනීම සඳහා කෘමිනාශක භාවිතා කරයි. අතීත මිනිසා මුළු හදවතින් ම මේ සිරිත්විරිත් සමඟ බැඳී කටයුතු කළත් විද්‍යාව හා තාක්ෂණය දියුණුව සමඟ වර්තමාන පරපුර මෙම සිරිත්විරිත් ප්‍රශ්නවලට ලක් කරමින් සිටී. මෙය ද වර්තමාන සමාජයෙන් ගිලිහී යාමට හේතුවක් වී ඇත. මෙවැනි සිරිත් සඳහා කාලයේ දී බලපෑම ඇති වීම, කාලය සමඟ මිනිසා කාර්යය බහුල වීම, අතීත සමාජයට වඩා වර්තමාන සමාජය සංකීර්ණ වීම තුළ යම් පිරිසක් හෝ මේ පිළිබඳ ව භක්තියාදරයක් පැවතුණත් ඒ සඳහා සම්බන්ධ වීමට කාලයක් නොමැති වීම, පාරම්පරික තනතුරු හිස්වීම තුළ නව පරපුර මෙම තනතුරු භාර ගැනීමට අකමැති වීම, අඛණ්ඩ ව වසරකට වරක් කරගෙන ආ මෙම මංගල්‍යය ස්වාභාවික පාරිසරයේ බලපෑම් මත එහි කටයුතු මඟ හැරී යාම හේතුවෙන් චාරිත්‍ර අතහැරී යාම, උක්ත දක්වන ලද කරුණු විමසා බැලීමෙන් අනතුරු ව අතීතයේ දක්නට ලැබුණු මුට්ටි මංගල්‍යය වර්තමානය වන විට ක්‍රමයෙන් මඟ හැරී යන තත්ත්වයකට පත් වී ඇති බව තහවුරු කළ හැකි ය.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


දළුපොත, මහින්ද කුමාර. (2003) *මුට්ටි මංගල්‍යයේ වගතුග*, : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ.

දළුපොත, මහින්ද කුමාර (2005) *වැව හා සංස්කෘතිය*, : ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 675, මරදාන පාර, කොළඹ


**සම්මුඛ සාකච්ඡා**

**ඒ.එච්.එම්. රංබණ්ඩා** - පෙර සිටි වෙල් විදානේ කෙනෙකි.

**ඒ.එච්.එම්. හේරත්බණ්ඩා** - ගම්මානයේ කපු මහතා.

**ඒ.එච්.එම්. උක්කුමැණිකා** - පැරණි ගම්වාසන්.